සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
## ஆண்டிறுதி மதிப்பீடு - 2021
## Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper | I | කාලය / காலம் / Time | පැය 01 |
|---|---|---|---|---|---|---|---|

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) දීපවංසය වැදගත් වන්නේ මින් කුමන කරුණක් නිසා ද?
(1) කරුණු කෙටියෙන් දක්වා තිබීම
(2) පැරණිම වංසකතාව වීම
(3) දේශපාලන තොරතුරු ලබාගත හැකිවීම
(4) සිදුවීමට සමකාලීන තොරතුරු සඳහන් කර තිබීම

(02) හෝපිටිගමු ටැම් ලිපිය සකස් කරවා ඇත්තේ,
(1) විහාරාරාම පාලනය පිළිබඳ දැනුවත් කිරීමට ය.
(2) පුද්ගලයින්ගේ සේවය ඇගයීම සඳහා ය.
(3) රජයේ නීති මහජනතාවට දැනුම් දීමට ය.
(4) රජයට ගෙවිය යුතු බදු පිළිබඳ දැනුවත් කිරීමට ය.

(03) ප්‍රාග් ඓතිහාසික මානවයින් වාසය කළ තෙත් කලාපීය එළිමහන් වාසස්ථානයක් වන්නේ මින් කුමක් ද?
(1) බෙල්ලන්බැඳි පැලැස්ස (2) පාහියන් ලෙන
(3) හෝර්ටන් තැන්න (4) බණ්ඩාරවෙල

(04) රතුපාට ගුරුගල් ආලේප කරන ලද මිනිස් ඇටසැකිලි කොටස් හමුවී ඇති ප්‍රදේශයකි.
(1) අලිගල (2) පොතාන (3) බුන්දල (4) පාහියන්ගල

(05) සකපෝරුව භාවිත කරමින් වළං නිෂ්පාදනය කළ බවට තොරතුරු ලබාදෙන පූර්ව ඓතිහාසික යුගයට අයත් ජනාවාසයක් පිහිටි ස්ථානයක් වන්නේ,
(1) වල්ගම්පත්තුව (2) හල්දුම්මුල්ල
(3) මාංතොට (4) රාවණා ඇල්ල

(06) ප්‍රාදේශීය පාලන බලයක් හිමිවූ පරුමකවරුන්ට පැවරී තිබූ ප්‍රධාන කාර්යය වූයේ,
(1) වැව් පද්ධතිය භාරව කටයුතු කිරීම ය. (2) රජුට අවශ්‍ය සේවාවන් සැපයීම ය.
(3) ගම් වැව නඩත්තු කිරීම ය. (4) ගම් අතර සහයෝගීතාව වර්ධනය කිරීම ය.

(07) මෙරට ඉතිහාසයේ පළමුවරට සංවිධානාත්මක සටන් ව්‍යාපාරයක් දියත් කිරීමේ ගෞරවය හිමිවන්නේ,
(1) පණ්ඩුකාභය රජුට ය. (2) වසභ රජුට ය.
(3) දුටුගැමුණු රජුට ය. (4) වළගම්බා රජුට ය.

(08) විවිධ දීමනා පිළිබඳව තොරතුරු සඳහන් ශිලා ලිපිවල වටාපතක සලකුණ යෙදීමෙන් අදහස් වන්නේ,

(1) පාරිශුද්ධත්වයයි. (2) දිගුකාලීන පැවැත්මයි.

(3) මතු ආත්මයේ ලැබෙන ප්‍රතිවිපාකයි. (4) රාජකීයත්වයයි.

(09) ලංකාපට්ටන නමින් හැඳින්වෙන කුඩා නැව් තොටින් මෙරටට වැඩමවා ඇත්තේ,

(1) අකුධාතූන් වහන්සේ ය. (2) ලලාට ධාතූන් වහන්සේ ය.

(3) දන්ත ධාතූන් වහන්සේ ය. (4) ශ්‍රී මහා බෝධීන් වහන්සේ ය.

(10) නානාදේශී වෙළඳ සංවිධානයට අයත් ලෝහ මුද්‍රාවක් හමුවී ඇත්තේ කුමන ප්‍රදේශයෙන් ද?

(1) බෝවත්තේගලින් (2) හම්බන්තොටින්

(3) මහියංගණයෙන් (4) සීගිරි ජල උද්‍යානයෙන්

♦ පහත සඳහන් තොරතුරු ඇසුරින් 11 සහ 12 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - ජල සංරක්ෂණය B - අපවිත්‍ර ජලය කළමනාකරණය

C - උමං මඟින් ජලය සැපයීම D - ගංවතුර පාලනය

E - ශල්‍ය වෛද්‍ය තාක්ෂණය F - උද්‍යාන නිර්මාණය

(11) වැව් ප්‍රපතනය හා සම්බන්ධ තොරතුරු සඳහන් පිළිතුර කුමක් ද?

(1) B හා D (2) A හා D (3) B හා C (4) D හා F

(12) ආලාහන පිරිවෙන් සංකීර්ණය හා සම්බන්ධ තොරතුරු සඳහන් වන්නේ කුමන පිළිතුරේ ද?

(1) B හා E (2) F හා C (3) D හා F (4) A හා C

(13) අතීත සමාජයේ කාන්තාවන් විශේෂ ගෞරවාදරයට පත්වූයේ,

(1) මව්වරුන් ලෙස ඉසිලූ වගකීම නිසා ය.

(2) කුල ගෞරවය ආරක්ෂා කළ නිසා ය.

(3) බුදු දහමට අනුව කටයුතු කළ නිසා ය.

(4) කාන්තාවන් රාජ්‍ය පාලනයට සම්බන්ධ වූ නිසා ය.

(14) පැරණි රජවරුන් පනවන ලද නීති ඇතුළත් සෙල්ලිපි කිහිපයක් I තීරුවේ ද ඒවායේ ඇතුළත් තොරතුරු II තීරුවේ ද දක්වේ. I තීරුවේ අනුපිළිවෙළට II තීරුව සමඟ ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. අනුරාධපුර පුවරු ලිපිය | A. තිසිකලට සී සෑම නොකරන්නේ නම් දඩ ගෙවීම |
| 2. කොන්ඩවට්ටවාන් ලිපිය | B. මිනී මැරීමට දඬුවම එල්ලා මැරීම |
| 3. වේවැල්කැටිය සෙල් ලිපිය | C. පොහොය දිනවල වෙළඳාම් කරන්නේ නම් බදු ගෙවීම |
| | D. උස් බිම්වල කැලෑ නොකැපීම |

(1) ADB (2) BCD (3) DCA (4) DAB

♦ පහත A සිට G දක්වා ඇති සාහිත්‍ය ග්‍රන්ථ ඇසුරෙන් 15 - 16 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - මයූර සංදේශය E - සිදත් සඟරාව

B - සිංහල බෝධි වංශය F - සද්ධර්මාලංකාරය

C - ගුත්තිල කාව්‍යය G - පැරකුම්බා සිරිත

D - දළඳා සිරිත

(15) ගම්පොළ යුගයට අයත් සාහිත්‍ය ග්‍රන්ථ දක්වෙන පිළිතුර කුමක් ද?
(1) AB (2) AF (3) CD (4) DE

(16) කුරුණෑගල යුගයට අයත් සාහිත්‍ය ග්‍රන්ථ දක්වෙන පිළිතුර කුමක් ද?
(1) BE (2) BD (3) EF (4) CD

(17) මහනුවර රාජධානිය වැඩිම කාලයක් පාලනය කළ රජු කවුරුන් ද?
(1) සේනාසම්මත වික්‍රමබාහු (2) ශ්‍රී වික්‍රම රාජසිංහ
(3) කීර්ති ශ්‍රී රාජසිංහ (4) දෙවන රාජසිංහ

(18) මහනුවර රාජධානි සමයේ පැවති ඉඩම් භුක්ති ක්‍රමය අනුව පරවේණිගම් වශයෙන් හඳුන්වා ඇත්තේ,
(1) රජවාසල ප්‍රයෝජනය සඳහා වෙන්වූ ඉඩම් ය.
(2) රදළ ප්‍රධානීන්ට ප්‍රදානය කළ ඉඩම් ය.
(3) ආගමික ස්ථාන සඳහා ප්‍රදානය කළ ඉඩම් ය.
(4) ගම්වැසියන් පරම්පරාගතව භුක්තිවිඳි ඉඩම් ය.

(19) උඩරට ආර්ථිකය පිළිබඳ පහත දක්වා ඇති ප්‍රකාශ අතුරෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) වැඩි ඉඩම් ප්‍රමාණයක් හේන් වගාවට යොදා තිබිණි.
(2) දැව, ලෝහ හා ලාක්ෂා කර්මාන්ත පැවතිණි.
(3) වෙළඳාම පදනම් වූ ආර්ථික ක්‍රමයක් පැවතිණි.
(4) ආර්ථික රටාව ස්වයංපෝෂිත විය.

- VOC වෙළඳ සමාගම පිහිටුවීම
- ජාවා දූපතේ බතාවිය තම මූලස්ථානය කරගැනීම
- උඩරට රාජධානියේ විදේශ වෙළඳාමට බාධාවන ගිවිසුම් ඇතිකර ගැනීම

(20) ඉහත තොරතුරු හා සම්බන්ධ බටහිර ජාතිය වූයේ,
(1) ප්‍රංශයින් (2) පෘතුගීසීන් (3) ලන්දේසීන් (4) ඉංග්‍රීසීන්

(21) යාපනය රාජධානිය බිඳ වැටීමට බලපෑ හේතුවක් නොවන පිළිතුර තෝරන්න.
(1) ජනතාව කතෝලික ආගම වැළඳ ගැනීම
(2) රාජ්‍ය උරුමකරුවන් අතර බල අරගලය
(3) ප්‍රමාණවත් හමුදාවක් යාපනයට නොසිටීම
(4) ජනතාවගේ අසමගිය

(22) ඉංග්‍රීසීන්ට උඩරට යටත් කරගැනීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම සඳහා උපක්‍රමශීලීව කටයුතු කළ නිලධාරියා
(1) තෝමස් මෙට්ලන්ඩ් (2) මුත්තුසාමි
(3) රොබට් බ්‍රවුන්රිග් (4) ජෝන් ඩොයිලි

(23) පොදු අරමුණක් ජයගැනීම සඳහා විවිධ ජනකොටස් ඒකරාශීව 1919 පිහිටුවාගත් සංවිධානය කුමක් ද?
(1) පහතරට නිෂ්පාදන සංගමය (2) ලංකා ජාතික සංගමය
(3) හලාවත සංගමය (4) අමද්‍යප ව්‍යාපාරය

(24) 19 වන සියවසේ දී මිෂනාරි සමාගම්වල ක්‍රියාකලාපයන්ට එරෙහිව සිදුවූ ජාතික පුනරුද ව්‍යාපාරය සම්බන්ධ අදහස් යුගල කිහිපයක් පහත දක්වේ. ඒවායින් නොගැලපෙන යුගලය තෝරන්න.
(1) පූජ්‍ය වලානේ සිද්ධාර්ථ හිමි - විද්‍යාලංකාර පිරිවෙන පිහිටුවීම
(2) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි - පානදුරාවාදය පැවැත්වීම
(3) සිද්දි ලෙබ්බේ මහතා - කොළඹ සහිරා විද්‍යාලය පිහිටුවීම
(4) අනගාරික ධර්මපාලතුමා - මහාබෝධි සඟරාවට ලිපි සැපයීම

(25) "උදයභානු" නමින් පුවත්පතක් ආරම්භ කරන ලද්දේ,
(1) සිද්දි ලෙබ්බේ මහතා (2) අරුමුග නාවලර් තුමා
(3) පොන්නම්බලම් රාමනාදන් මහතා (4) පොන්නම්බලම් අරුණාචලම් මහතා

♦ පහත A සිට F දක්වා දී ඇති ප්‍රකාශ ඇසුරෙන් අංක 26 - 27 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
A - සර්වජන ඡන්දබලය හඳුන්වාදීම
B - දිවයින පළාත් පහකට බෙදීම
C - ව්‍යවස්ථාදායක සභාවේ මුල්වරට නිලනොලත් බහුතරය ඇතිවීම
D - කෘෂිකාර්මික සංවර්ධනයට පදනම වැටීම
E - පළාත්බද නියෝජනය හඳුන්වාදීම
F - උගත් ලාංකිකයෙකු ව්‍යවස්ථාදායක සභාවට පත්වීම

(26) ඩොනමෝර් ප්‍රතිසංස්කරණය හා සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) CB (2) AB (3) AD (4) EF

(27) මැනිං ප්‍රතිසංස්කරණ හා සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) AF (2) DE (3) BC (4) CE

(28) පහත ප්‍රකාශ අතුරෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) ලංකාවේ තේ වගාවේ ආරම්භකයා ජේම්ස් ටේලර්ය.
(2) සිංකෝනා ශාකයෙන් ඖෂධ නිපදවයි.
(3) 1880 වන විට ලංකාවේ පොල්වතු හිමියන්ගෙන් 90%ක් ලාංකිකයෝ ය.
(4) මෝටර් රථ කර්මාන්තයේ දියුණුවට රබර් මිල ඉහළ යාමට හේතුවිය.

(29) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුවට පත්වන මන්ත්‍රීන් සංඛ්‍යාව කොපමණ ද?
(1) 196 (2) 225 (3) 29 (4) 226

(30) ශ්‍රී ලංකාවම එකම ඡන්ද කොට්ඨාසයක් බවට පත්වන මැතිවරණයන් දක්වෙන පිළිතුර තෝරන්න.
(1) ජනාධිපතිවරණය හා පාර්ලිමේන්තු මැතිවරණය
(2) පළාත් සභා මැතිවරණය හා ජනමත විචාරණය
(3) පළාත් පාලන මැතිවරණය හා ජනාධිපතිවරණය
(4) ජනමත විචාරණය හා ජනාධිපතිවරණය

(31) ශ්‍රී ලංකාවේ ප්‍රථම කාර්මික ජනපදය පිහිටුවන ලද්දේ,
(1) රත්මලානේ ය. (2) කටුනායක ය. (3) ඒකල ය. (4) කොග්ගල ය.

(32) සංගීතඥයෙකු, ඉංජිනේරුවරයෙකු, කවියෙකු, විද්‍යාඥයෙකු වශයෙන් අංශ කිහිපයක ප්‍රවීණත්වය දරමින් පුනරුද සමයේ විශ්ව කලාකෘති ඉදිරිපත් කළ චිත්‍ර ශිල්පියා වූයේ,
(1) මයිකල් ආන්ජලෝ ය. (2) ගැලිලියෝ ගැලිලිය
(3) ලියනාඩෝ ඩාවින්චි ය. (4) රෆායල් සැන්ඩිය

(33) විශ්වය පිළිබඳ ඉදිරිපත් කළ නව මත නිසා තාරකා විද්‍යාවේ පියා වශයෙන් හඳුන්වනු ලැබුවේ,

(1) ජොහැන්නස් ගුටන්බර්ග් ය. (2) නිකලස් කොපර්නිකස් ය.

(3) ගැලීලියෝ ගැලිලිය (4) ජොහැන්නස් කෙප්ලර් ය.

- පහත දක්වෙන A හා B ප්‍රකාශ ඇසුරෙන් අංක 34, 35 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - මියුල් යන්ත්‍රය

B - රෝලර් යන්ත්‍රය

(34) පේෂ කර්මාන්තය සම්බන්ධයෙන්,

(1) A හා B සත්‍ය වේ. (2) A හා B අසත්‍ය වේ.

(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

(35) යකඩ හා වානේ කර්මාන්තය සම්බන්ධයෙන්,

(1) A හා B සත්‍ය වේ. (2) A හා B අසත්‍ය වේ.

(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

(36) 1905 දී රුසියාවේ රාජ්‍ය විරෝධී කැරැල්ලක් ඇතිවීමට ආසන්නම හේතුව කුමක් ද?

(1) රුසියානු වැසියන් හමුදාවට බඳවා ගැනීම

(2) ජනතාව පීඩාවට පත්කරමින් බදු අය කිරීම

(3) දූෂිත ඒකාධිපති රාජාණ්ඩු ක්‍රමය

(4) ජපානය සමඟ යුද්ධයෙන් රුසියාව පරාජය වීම

- පහත A B C D වලින් දක්වෙන ප්‍රකාශ පද යුගල අධ්‍යයනය කර 37 සිට 39 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | |
|---|---|---|---|
| A. | 1. ඒකාධිපති පාලනය | B. | 1. සමූහ ගොවිපළ |
| | 2. නීතියේ සාරය | | 2. රුසියන් විප්ලවය |
| C. | 1. කාර්මීකරණය | D. | 1. එක්සත් ජාතීන් |
| | 2. පරිසර දූෂණය | | 2. වුඩ්රෝ, විල්සන් |

(37) පළමුවැන්නේ ආරම්භයට දෙවැන්නේ බලපෑම හේතු වූ බව පෙන්වන පද යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

(38) පළමුවැන්න අඩපණ වීම දෙවැන්න නිසා සිදුවූ බව පෙන්වන පද යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

(39) පළමුවැන්න හා දෙවැන්න අතර සබඳතාවක් නොපෙන්වන පද යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

(40)
- සාමාජික රටවල දායක මුදල් එකතු කිරීම
- අයවැය අනුමත කිරීම
- මහලේකම් පත්කිරීම
- නව සාමාජිකයන් බඳවා ගැනීම

ඉහත සඳහන් කාර්යයන් අයත්වන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කුමන ආයතනයකට ද?

(1) ආරක්ෂක මණ්ඩලයට (2) මහා මණ්ඩලයට

(3) මහලේකම් කාර්යාලයට (4) ආර්ථික හා සමාජීය මණ්ඩලයට

(ලකුණු 2 x 40 = 80)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2021
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය තුනයි. |

සැලකිය යුතුයි:
- I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) ගම්පොළ , පේදුරුතුඩුව , සීගිරිය , කෝට්ටේ , මාගම , පොම්පරිප්පුව , නාච්චදූව වැව, මඩකලපුව, දැදුරු ඔය ගල්ඔය ජලාශය, මහාතිත්ථ, ත්‍රිකුණාමලය (ලකුණු 12)

(ii) සුවස් ඇළ, රෝමය, කැලිකට්, මලය අර්ධද්වීපය, බොම්බාය, බ්‍රිතාන්‍ය දූපත් (ලකුණු 06)

(ආ) (i) පහත A, B, C, D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරුවලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

A - උණ රෝගීන්ට විශේෂිත රෝහලක් සෑදවූ රජු
B - "රාජ්‍යය නම් මම" යි ප්‍රකාශ කළ ප්‍රංශයේ රජු
C - ශ්‍රී ලංකාවේ ප්‍රථම ජනාධිපතිවරයා
D - පුනරුද සමයේ ඩිවිනා කොමිඩියා ග්‍රන්ථය රචනා කළ කතුවරයා

(ලකුණු 04)

- A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.


A

(i) (1) A අක්ෂරයෙන් පෙන්වන පින්තූරයෙන් දක්වෙන්නේ කුමක් ද?
(2) මෙය පිහිටි ප්‍රදේශයේ නම ලියන්න.
(3) මෙය අයත්වන්නේ කුමන ඓතිහාසික යුගයකට ද?
(4) මේවා භාවිත කර ඇත්තේ කව්රුන් ද?
(ලකුණු 04)


B

(ii) (1) B වලින් දැක්වෙන පිංතූරයෙන් පෙන්වන පුද්ගලයාගේ නම කුමක් ද?
(2) ඔහු අයත් වන්නේ කුමන රටකට ද?
(3) මොහු නායකත්වය දුන් දේශපාලන කණ්ඩායම කුමක් ද?
(4) මොහුගේ නායකත්වයෙන් සිදුකළ විප්ලවයේ නම ලියන්න.
(ලකුණු 04)

## II කොටස

(02) (i) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයට අයත් තොරතුරු ලබාදෙන ස්ථාන තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පූර්ව ඓතිහාසික යුගයේ මානව ජීවන රටාවේ සිදුවූ පරිවර්තන හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ භාවිත කළ තාක්ෂණය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ස්වරූපය කරුණු තුනක් ඉදිරිපත් කරමින් විස්තර කරන්න. (ලකුණු 06)

(03) (i) පහත A, B, C ,D යටතේ දක්වා ඇති නිලධාරීන් හැඳින්වීම සඳහා සෙල්ලිපිවල භාවිත කර ඇති නාම සඳහන් කරන්න.

A - භෝජනශාලා අධිකාරි B - නාගරික වාස්තු විද්‍යාඥයා

C - රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානී (ලකුණු 03)

(ii) ගමික ඉටුකළ කාර්යයන් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) රජුගෙන් රටවැසියාට ඉටු විය යුතු යුතුකම් දෙකක් සඳහන් කර ඒවා ඉටුකර ඇති ආකාරය උදාහරණ දෙමින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) පළමුවන විජයබාහු රජතුමා මෙරට බිහිවූ ශ්‍රේෂ්ඨ පාලකයෙකු බව කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

(04) (i) පහත ABC යටතේ දක්වා ඇති වැව් නිර්මාණය කරවූ රජවරුන්ගේ නම් අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - කලා වැව

B - මින්නේරි වැව

C - තිසා වැව (ලකුණු 03)

(ii) පහත A B C D යටතේ දක්වා ඇති තොරතුරුවලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

A - කලාවැවේ ජලය තිසා වැවට ගෙන යන ඇළ මාර්ගය

B - ලංකා ඉතිහාසයේ පළමුවරට අමුණක් සෑදූ පාලකයා

C - බෝධියේ ආරක්ෂාව සඳහා බෝධිය වටා සාදන ලද ගෘහය

D - පුරාණ යකඩ නිස්සාරණය පිළිබඳ තොරතුරු ලබාදෙන සබරගමු පළාතට අයත් ප්‍රදේශය (ලකුණු 04)

(iii) අතීතයේ මහා පරිමාණ වැව් ඉදිකිරීමේ අරමුණු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) අපේ පැරණි වාරි ශිල්පීන් වැව්බැම් ඉදිකිරීම සඳහා යොදාගත් තාක්ෂණික ශිල්ප ක්‍රම තුනක් උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(05) (i) සැලසුම් සහගත නිමාවකින් යුතු පැරණි නගරයක දක්නට ලැබුණු නාගරික ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) පොළොන්නරු රාජධානිය පරිහානියට බලපෑ හේතු හතරක් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ ශ්‍රේෂ්ඨත්වය කරුණු දෙකක් ඉදිරිපත් කරමින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) දෙවන නාගරීකරණ සමයේ ගෘහ නිර්මාණ හා සාහිත්‍ය කලාවේ දැකිය හැකි වූ සුවිශේෂී ලක්ෂණ තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(06) (i) උඩරට රාජධානිය පාලනය කළ නායක්කර් වංශික රජවරු තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

(ii) උඩරට ප්‍රාදේශීය පාලනය බෙදා තිබූ දිසාවන් හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) උඩරට රාජධානියේ අධිකරණ කටයුතු ක්‍රියාත්මක වූ ආකාරය කරුණු දෙකක් ඉදිරිපත් කරමින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) උඩරට සමාජ සංවිධානයේ විශේෂ ලක්ෂණ කරුණු තුනක් ඇසුරින් විස්ර කරන්න. (ලකුණු 06)

(07) (i) පහත A , B ,C වශයෙන් දක්වා ඇති දේශපාලන පක්ෂවල ආරම්භක නායකයින් අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - එක්සත් ජාතික පක්ෂය

B - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය

C - ෆෙඩරල් පක්ෂය (ලකුණු 03)

(ii) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් අධිකරණ ආයතන හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) a. නිදහස ලැබීමට පෙර පිහිටවූ ගොවිජනපද තුනක් සඳහන් කරන්න.
b. ගොවිජනපද පිහිටුවීමේ අරමුණු දෙකක් ලියන්න. (ලකුණු 05)

(iv) ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසු සමාජ සුබසාධනය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

## III කොටස

(08) (i) කාර්මික විප්ලවයේ බලපෑමට ලක්වීම නිසා,

A - මාර්ග පද්ධතිය දෙගුණයක් පුළුල් වූ රට

B - අති විශාල කාර්මික දියුණුවක් ලැබූ ආසියාතික රට

C - ප්‍රථම වරට මෝටර් රථය නිපදවූ රට

අනුපිළිවෙළින් ලියා දක්වන්න. (ලකුණු 03)

(ii) බ්‍රිතාන්‍යයේ කාර්මික විප්ලවය ආරම්භ වීමට බලපෑ හේතු හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) කාර්මික විප්ලවය සමාජ ක්ෂේත්‍රයේ ඇති කළ වෙනස්කම් දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ ක්ෂේත්‍රවල වෙනස්කම් රාශියක් ඇති කිරීමට කාර්මික විප්ලවය හේතු වූ ආකාරය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(09) (i) පළමුවන ලෝක සංග්‍රාමයේදී මධ්‍යම බලවතුන්ගේ පිලට අයත් වූ රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත A B C D වශයෙන් දක්වා ඇති තොරතුරුවලට ගැළපෙන පිළිතුර වරහන තුළින් තෝරා අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - ජර්මනිය එක්සත් කළ රාජ්‍ය නායකයා

B - ජාතීන්ගේ සංවිධානයේ නිර්මාතෘවරයා

C - ජර්මනියට විරුද්ධව යුධ පෙරමුණක් බිහිකරගත් බ්‍රිතාන්‍ය අගමැති වරයා ය.

D - පළමුවන ලෝක සංග්‍රාමයෙන් පසුව සාම සාකච්ඡාවලට සහභාගී වූ ප්‍රංශ අගමැතිවරයා


(වුඩ්රෝ විල්සන්, ජෝන් මාර්ෂල්, ක්ලෙමන් ෂෝ, ඔටෝවොන් බිස්මාර්ක්,මාර්ෂල් ටිටෝ, වින්ස්ටන් චර්චිල්, වික්ටෝරියෝ ඔලැන්ඩෝ)

(ලකුණු 04)


(iii) පළමුවන ලෝක සංග්‍රාමයේ ප්‍රතිඵල දෙකක් සැකවින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) දෙවන ලෝක සංග්‍රාමයට බලපෑ හේතු තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(01) (අ) (i) ප්‍රශ්නය සඳහා



(01) (අ) (ii) ප්‍රශ්නය සඳහා



සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2021
Year End Evaluation

# පිළිතුරු පත්‍රය
# Marking Scheme

ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II

## I පත්‍රය

| | | | |
|---|---|---|---|
| (1) 2 | (11) 2 | (21) 1 | (31) 3 |
| (2) 3 | (12) 1 | (22) 4 | (32) 3 |
| (3) 1 | (13) 1 | (23) 2 | (33) 2 |
| (4) 4 | (14) 4 | (24) 1 | (34) 3 |
| (5) 2 | (15) 2 | (25) 2 | (35) 4 |
| (6) 1 | (16) 2 | (26) 3 | (36) 4 |
| (7) 3 | (17) 4 | (27) 4 | (37) 2 |
| (8) 4 | (18) 4 | (28) 3 | (38) 1 |
| (9) 3 | (19) 3 | (29) 2 | (39) 4 |
| (10) 2 | (20) 3 | (30) 4 | (40) 2 |

## II පත්‍රය

(01) (i) (අ) ලංකා / ලෝක සිතියම් පිළිතුරු පසුපිටේ අමුණා ඇත.

(ආ) A - හතරවන කාශ්‍යප
B - 14වන ලුවී
C - විලියම් ගොපල්ලව
D - අලගියරි ඩාන්ටේ (ලකුණු 04)

(ii) (i) සුසාන භූමියක්
(ii) ඉබ්බන්කටුව / දඹුල්ල
(iii) පූර්ව ඓතිහාසික
(iv) පරුමකවරුන් / ප්‍රභූන් (ලකුණු 04)

(iii) (i) වී. අයි ලෙනින්
(ii) රුසියාවට
(iii) බෝල්ෂෙවික්
(iv) රුසියානු විප්ලවය (ලකුණු 04)

## II කොටස

(02) (i)
- පාහියන්ගල
- කිතුල්ගල බෙලිලෙන
- බටදොඹ ලෙන
- මිනිහාගල් කන්ද
- බුන්දල
- පොතාන
- මාතොට (ලකුණු 03)

(ii)
- පිලිස්සූ මැටි වළං භාවිතය
- ස්ථිරවාසීතාවය
- කෘෂිකර්මාන්තයට යොමුවීම
- යකඩ භාවිතය
- ක්‍රමවත් සුසාන චාරිත්‍ර අනුගමනය (ලකුණු 04)

(iii)
- මැටි භාන්ඩ නිෂ්පාදනයට සකපෝරුව භාවිතය
- නිවාස සකස්කර ගැනීම
- සුසාන සකස් කර ගැනීම
- යකඩ නිෂ්පාදනය සිදුකිරීම (ලකුණු 05)

(iv)
- වාපි ගම්මාන බිහිවීම
- ඉටු කරගන්නා කාර්යයන් අනුව ගම් බිහිවීම
- වෘත්තීන් අනුව ගම් බිහිවීම (ලකුණු 06)

(03) (i) A - බතගු B - නගර වුඩික C - කනපෙඩික (ලකුණු 03)

(ii)
- ගමේ වැව නඩත්තු කිරීම හා ජලය බෙදා හැරීම
- ගම් නායකයින් අතර සබඳතා ගොඩනගා ගැනීම
- පොදු වැඩ සඳහා ගමේ නායකත්වය ගැනීම
- ගමේ වැසියන්ගේ සුබසාධනය සැලසීම
- ගමේ පැවති ආරවුල් විසඳීම (ලකුණු 04)

(iii)
- රටේ භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කිරීම
- රට වැසියා ආරක්ෂා කිරීම
- රටේ ආර්ථිකය දියුණු කිරීම
- රට වැසියාගේ ආර්ථික සංවර්ධනය ඇති කිරීම (ලකුණු 05)

(iv)
- චෝළ ආධිපත්‍යයෙන් රට බේරා ගැනීම
- රටේ භෞමික අඛණ්ඩත්වය රැකගැනීම
- පොළොන්නරුව පාලන මධ්‍යස්ථානයක් කරගැනීම
- පරිපාලනය සංවිධානය කිරීම
- දුර දක්නා නුවණින් යුතුව විදේශ සබඳතා ගොඩ නගා ගැනීම
- සොලීන් විනාශ කළ වෙහෙර විහාර නැවත ඇති කිරීම (ලකුණු 06)

(04) (i) A - ධාතුසේන රජු B - මහසෙන් රජු C - දේවානම් පියතිස්ස රජු (ලකුණු 03)

(ii) A - යෝධ ඇළ / ජය ගඟ B - බෝධිසරය
C - ඉලනාග රජු D - සමනල වැව

(iii)
- කෘෂිකර්මාන්තයට අවශ්‍ය ජලය ලබා ගැනීම
- ගංවතුර පාලනය කිරීම
- ජල සංරක්ෂණය
- නාගරික ජනතාවගේ වෙනත් ජල අවශ්‍යතා සඳහා (ලකුණු 05)

(iv)
- මිටි කඳු ගැට හරහා ගංගා ගලන විට ඒවා හරස්කර බැමි බැඳීම
  උදා:- බසවක්කුලම වැව
- කඳු ගැට නොමැති ප්‍රදේශවල කෘතිම පස් කණ්ඩි දමා චාපාකාර බැමි බැඳීම
  උදා :- යෝධ වැව
- පොළොවේ පිහිටි ගල් තෝරා ගෙන වැව් බැම්ම සෑදීම
  උදා :- රාජාංගනය වැව
- විවිධ පස්වර්ග බොරලු දමා වැව් බැම්ම තලා ශක්තිමත් කිරීම
- මව් පාෂාන්තය පිළිබඳ අවධානය යොමු කරමින් ගිලා නොබසින සේ වැව් බැම්ම සකස් කිරීම (ලකුණු 06)

(05) (i)
- වීදි
- වෙළෙඳපොළ
- ආගමික ගොඩනැගිලි
- සෞන්දර්යාත්මක උද්‍යාන
- ආරක්ෂක ප්‍රාකාර (ලකුණු 03)

(ii)
- දුර්වල පාලකයින් බලයට පත්වීම
- කාලිංග හා පාණ්ඩ්‍ය වංශිකයින්ගේ බල අරගලය
- ආර්ථික පරිහානිය
- කාලිංග මාඝගේ ආක්‍රමණය (ලකුණු 04)

(iii)
- චන්ද්‍රබානු ජාවකගේ ආක්‍රමණ දෙකකට මුහුණදී ජය ගැනීම
- කාලිංග මාඝගෙන් රට බේරා ගැනීම
- ශ්‍රේෂ්ඨ පඩිවරයෙක් වීම
- රටේ ආර්ථික, ආගමික හා අධ්‍යාපන සංවර්ධනයට කටයුතු කිරීම
- දඹදෙණි කතිකාවත කරවීම
- වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම (ලකුණු 05)

(iv) ගෘහ නිර්මාණ
- දකුණු ඉන්දියානු ආභාෂය ලැබීම උදා :- යාපහුව
- කාම්බෝජ ආභාෂය ලැබීම උදා :- යාපහුව
- පිළිම ගෙය සම්බන්ධ කොට දේවාල ඉදිකිරීම උදා :- ගඩලාදෙණිය
- ලී කැටයම් සහිත ගොඩනැගිලි ඉදිකිරීම (ලකුණු 06)

(06) (i)
- ශ්‍රී විජයරාජසිංහ
- කීර්ති ශ්‍රී රාජසිංහ
- රාජාධි රාජසිංහ
- ශ්‍රී වික්‍රම රාජසිංහ (ලකුණු 03)

(ii)
- තුන් කෝරළය
- බින්තැන්න
- සතර කෝරළය
- මාතලේ
- ඌව
- වෙල්ලස්ස
- සබරගමුව
- නුවරකලාවිය (ලකුණු 04)

(iii)
- ඉහළම අධිකරණය රජු සතු වීම
- සෑම නිලධාරියෙකුටම තම පදවිය අනුව අධිකරණ බලතල හිමිවීම
- රජු විසින්ම පමණක් අසන නඩු තිබීම
- වරද කරුවන්ට විවිධ දඬුවම් පැමිණවීම (ලකුණු 05)

(iv)
- ඉඩම් භුක්තිය පදනම්ව සමාජයේ ඉඩම් කොටස් විම
- ස්වයං පෝෂිත ගැමි සමාජයකි

- පන්සල හා බැඳුණු ගුණගරුක ජීවිතය
- සමාජ සබඳතා කුල ක්‍රමයට පදනම් වීම
- විවාහ ක්‍රම තුනක් පැවතීම
- සහජීවනය ප්‍රධාන තැනක් ගැනීම (ලකුණු 06)

(07) (i) A. ඩී. එස්. සේනානායක මහතා

B. ඩී. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා

C. එස්. ජේ. වී. චෙල්වනායගම් මහතා (ලකුණු 03)

(ii)
- ශ්‍රේෂ්ඨාධිකරණය
- අභියාචනාධිකරණය
- මහාධිකරණය
- දිසා අධිකරණය
- පවුල් අධිකරණය
- මහේස්ත්‍රාත් අධිකරණය
- ප්‍රාථමික අධිකරණය (ලකුණු 04)

(iii) a. මින්නේරිය, කාගම, නාච්චදූව, බෙරගම, මිනිපේ, පරාක්‍රම සමුද්‍රය
රිදී බැඳි ඇළ, සංගිලි කන්දරාව, උනිච්චයි

b.
- තෙත් කලාපයේ ජනගහනය අඩු කිරීම
- රැකියා හිඟය අඩු කිරීම
- රටේ ආහාර නිෂ්පාදනය වැඩි කිරීම
- වියළි කලාපීය වැව් ප්‍රතිසංස්කරණය කිරීම
- වැඩි ඉඩම් ප්‍රමාණයක් වගා කිරීම (ලකුණු 3 + 2 = 05)

(iv)
- ග්‍රාමීය ප්‍රදේශවල රැකියා සැපයීම
- නිවාස ව්‍යාපෘති ඇති කිරීම
- සෞඛ්‍ය සේවය දියුණු කිරීම
- දිළිඳු සහන ලබාදීම
- මාර්ග සංවර්ධනය (ලකුණු 06)

## III කොටස

(08) (i) A. බෙල්ජියම B. ජපානය C. ජර්මනිය (ලකුණු 03)

(ii)
- වෙළඳාම දියුණුවීම
- සම්පත් බහුලව පැවතීම
- ධනවතුන් බිහිවීම
- දේශීය හා විදේශීය වෙළඳපොළ
- විද්‍යාත්මක දැනුම තිබීම
- ශ්‍රමය ලබා ගැනීමේ පහසුව (ලකුණු 04)

(iii)
- රැකියා අවස්ථා ඇතිවීම
- සමාජ පන්ති බිහිවීම
- ජීවන තත්වය දියුණු වීම
- පවුල් සමාජ බිඳවැටීම
- නාගරීකරණය වේගවත් වීම
- අයහපත් පරිසර නිර්මාණය
- විවධ වෘත්තීන් බිහිවීම
- විෂමාචාර පුරුදු ඇතිවීම (ලකුණු 05)

(iv) **ආර්ථික**
- වතුවගාව ආරම්භ වීම
- යන්ත්‍ර සූත්‍ර භාවිතය
- උගත් ධනවත් මධ්‍යම පන්තියක් ඇති වීම
- ධනවාදී ආර්ථික ක්‍රමයක් ඇතිවීම
- බැංකු ක්‍රම ඇතිවීම

**සමාජ**

- මාර්ග පද්ධති දියුණු වීම
- යටිතල පහසුකම් වර්ධනය
- සන්නිවේදනය දියුණු වීම (ලකුණු 06)


(09) (i)
- ජර්මනිය
- ඉතාලිය
- බල්ගේරියාව
- තුර්කිය
- ඔස්ට්‍රියාව
- හංගේරියාව (ලකුණු 03)

(ii) A. ඔටෝවන් බිස්මාර්ක් B. වුඩ්රෝ විල්සන්
C. වින්ස්ටන් චර්චිල D. ක්ලෙමන් ෂෝ (ලකුණු 04)

(iii)
- මධ්‍යම බලවතුන් පරාජයට පත්වීම
- අතිවිශාල ජිවිත හා දේපළ හානි සිදුවීම
- වර්සෙල්ස් ගිවිසුමෙන් ජර්මනියට දඬුවම් පැමිණවීම
- යුරෝපයේ ඒකාධිපති රාජාණ්ඩු බිඳවැටීම
- නිදහස් රාජ්‍ය බිහිවීම
- ඇමරිකා එක්සත් ජනපදය ලෝක බලවතෙකු වීම
- ජාතීන්ගේ සංගමය පිහිටුවා ගැනීම (ලකුණු 05)

(iv)
- හිට්ලර් ජර්මනියේ බලවත්වීම
- ඉතාලියේ මුසොලිනී බලවත් වීම හා ක්‍රියාකලාපය
- ජපානයේ ක්‍රියා කලාපය
- ජාතීන්ගේ සංගමය අසාර්ථක වීම (ලකුණු 06)

(01) (අ) (i) පිළිතුරු




(01) (අ) (ii) පිළිතුරු